# POLITICAL IDEOLOGIES

# (Part VI)

# ජාතිකවාදය

19 සහ 20 වැනි සියවස්වල වර්ධනය වූ ප්‍රධානතම දේශපාලන මතවාදයකි ,ජාතකි වාදය. (Nationalism).

එය දේශපාලන මතවාදයක් මෙන් ම, දේශපාලන හා සමාජ ව්‍යාපාරයක් ද වන අතර නූතන ලෝකයේ රාජ්‍යය, දේශපාලන ගැටුම් සහ අන්තර් රාජ්‍ය සම්බන්ධතා යන මේවා නිර්ණය කිරීමට බලපෑ ප්‍රධානතම සාධකයක් ද වේ.

ජාතිකවාදයේ කාර්යභාරය අමතක කළහොත්, නූතන ලෝකය තේරුම් ගැනීමට නොහැකි තරමට, නූතන ඉතිහාසයේ ගමන් මඟත්, මනුෂ්‍යයන්ගේ දේපාලන ඉරණමත් හැඩ ගැස්සීමට ජාතිකවාදය දායක වී තිබේ.

ජාතිකවාදය යන්න කෙටියෙන් දක්වන්නේ නම්, ''ජාතියක්'' යනුවෙන් තමන් ගැන ම ස්වයංඅවබෝධයක් ඇති ප්‍රජාවක් නිශ්චය දේශපාලන අරමුණක් සඳහා මෙහෙයවන ''ජාතිය'' පිළිබඳ අදහසයි.

ClassWork.LK

මතවාදයක්, චින්තන ධාරාවක් හැටියට ජාතිවාදයේ විශේෂත්ව දෙකක් පවතී.

1) ජාතිකවාදය යනුවෙන් ක්‍රමානකූල ඒකාග්‍ර චින්තනයක් නැත.

එය නිශ්චිත් චින්තකයකු හෝ දාර්ශනිකයකු හෝ සමඟ අනන්‍ය වී නැත. ඊට මනා චින්තකයෙක්ද නැත. මේ ගැන බෙනඩික්ට් ඇන්ඩර්සන් නම් දේශපාලන න්‍යායවේදියා 1983 දී පළ කළ *Imagined Communities* (පරිකල්පිත ප්‍රජාව) නම් කෘතියේ මනා ව පෙන්වා දී තිබේ.

ජාතිකවාදය දේශපාලනික වශයෙන් කොතරම් බලගතු වුවත්, එය දාර්ශනික වශයෙන් දිළිඳු ය. දාර්ශනික ඒකමතිකත්වයක් එහි නැත. අනෙකුත් දේශපාලන මතවාද මෙන් තමන්ගේම මහා චින්තකයන් හෝ න්‍යායවේදීන් හෝ ජාතිකවාදය විසින් බිහි කරනු ලැබ නැත. ''ජාතිකවාදයට හොබ්ස් කෙනෙකු, ද කොක්විල් කෙනෙකු, මාක්ස් කෙනෙකු තබා වේබර් කෙනෙක් ද නැත''-(ඇන්ඩර්සන්, 1983.14)

ClassWork.LK

2) මහා දාර්ශනිකයන්, චින්තකයන් විසින් නිර්මාණය නොකළත්, විවිධ සමාජවලින් බිහි වී ඇති ජාතිකවාදී මතවාදවල ව්‍යූහාත්මක සාම්‍යතා තිබීම යි.

නිද:- සිංහල ජාතිකවාදය, ජපාන ජාතිකවාදය, ඉංග්‍රීසි ජාතිකවාදය, රුසියානු ජාතිකවදය, ආදි වශයෙන් එකිනෙකට ඍජු ව කිසිදු සම්බන්ධයක් පවා නැති ජාතිකවාදවල ව්‍යූහාත්මක සංයුතිය එක සමාන ය.

ජාතික වාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගත හැකි ය.

i. නූතනවාදී ප්‍රවේශය. (Modernist)

මෙය 18 වැනි සියවසෙන් පසු ව යුරෝපයේ කාර්මික ධනවාදයත් ජාතික රාජ්‍යයක් වර්ධනය වීමේ ක්‍රියාවලින් සමඟ සම්බන්ධ ව ගොඩනැගුණු මතවාදයකි.

ClassWork.LK

ii. චිරන්තනවාදී ප්‍රවේශය - (Primordialist)

ජාතිකවාදය අවුරුදු දහස් ගණනක ඉතිහාසයක් ඇති, මනුෂ්‍ය ඉතිහාසය තරම් ම පැරණි සංසිද්ධියක් බව මින් ප්‍රකාශ කෙරේ.

iii. මෙවලම්වාදී ප්‍රවේශය - (Instrumentalist)

ජාතිය යන අදහස දේශපාලනඥයන් සහ දේශපාලන ප්‍රභූන් බලය ලබා ගැනීම සඳහා පාවිච්චි කරන මෙවලමක් බව මෙයින් කියැවේ.

''ජාතිය'' පිළිබඳ හැඟීමේ පදනම් සහ ජාතිකවාදය.

ජාතිකවාදයේ ප්‍රධානතම කාර්යය නම් ''යම්කිසි ප්‍රජාවකට තමන් සියලු දෙනා සාමූහිකව ගත් කල ''ජාතිය'' යන විශාල ප්‍රජාවට අයත් වෙති යි යන හැඟීම ගොඩ නැඟීම ය. එනම් ජාතිය යන ප්‍රජාවට අයත් වීම (Bdonging to the community called nation) යන හැඟීම යි.

ClassWork.LK

''ජාතියක්'' යන තනි ඒකකයක් ලෙස සිතන්නට ඔවුන් අතර පොදු බවක් පිළිබඳ ශක්තිමත් බවක් ද තිබිය යුතු ය. ජාතිකවාදීන් මෙය දක්වන්නේ 'ජාතික අනන්‍යතාව' (National Identity) යනුවෙනි. ජාතික අනන්‍යතා කාරක නම් භාෂාව, ආගම, සංස්කෘතිය, පොදු ඉතිහාසය සහ සමහර විට පොදු භෞමික ප්‍රදේශයකට අයත් වීම යි.

පොදු බව පිළිබඳ හැඟීමෙන් ආරම්භ වන ජාතිකවාදය පසු ව දේශපාලන ස්වරූපයක් අත්පත් කර ගනියි. එමඟින් 'ජාතිය' යන්නට දේශපාලන අනන්‍යතාවක් ලැබෙන අතර, ජනතාවට දේශපාලන ඉලක්ක ලබාදී ජාතිය දේශපාලන වශයෙන් මෙහෙයවයි. දේශපාලන නිදහස, ප්‍රදේශීය ස්වයං පාලනය, සහ ප්‍රජා කණ්ඩායම් අයිතිවාසිකම් මෙම දේශපාලන අරමුණු අතර ප්‍රධාන වේ.

Class Work LK

ස්වයං තීරණ අයිතිය (Right of self-determination) ජාතිකවාදය හා සම්බන්ධ ප්‍රධාන සංකල්පයකි. ඉන් අදහස් වන්නේ තමන්ගේ දේශපාලන ඉරණම තීරණය කිරීමේ අයිතිය සෑම ජාතියකට ම හිමි ය යන අදහස යි. දේශපාලන වශයෙන් වෙන ම රාජ්‍යයක් පිහිටුවා ගනිමින් වෙන් වීම, ප්‍රදේශීය ස්වයං පාලනය - ජාතික ස්වයං තීරණ අයිතිය මඟින් සාක්ෂාත් කරගන්නා අරමුණු ය.

දේශපාලන වශයෙන් ජාතිකවාදී මතවාදයේ කාර්යයක් වන්නේ 'ජාතියක්' ලෙස හඳුන්වන එක් ප්‍රජාවක්, අනෙකුත් ප්‍රජාවකගෙන් වෙන් කොට හඳුනා ගැනීම යි. පෙර ද කියූ පරිදි එහි නිර්ණායකයක් වන්නේ භාෂාව, ආගම, සංස්කෘතිය ආදි වූ ජාතික අනන්‍යතා කාරක ය. මෙසේ වෙනස් කොට හඳුනා ගැනීම අන්තයකට ගිය විට ''අප සහ සතුරා/සතුරන්'' යන ද්විත්ව විභේදනය ඔස්සේ ලෝකය දෙස බැලීමට ජාතිකවාදීහු පෙලඹෙති.

Class Work.LK

ජාතිකවාදය මතවාදයක් මෙන් ම දේශපාලන ව්‍යාපාරයක් ලෙස (18 සියවස සිට වර්තමානය තෙක්) ප්‍රධාන ස්වරූප දෙකකි.

i. ජාතික - රාජ්‍ය ජාතිකවාදය
ii. ජනවාර්ගික ජාතිකවාදය

## ජාතික - රාජ්‍ය ජාතිකවාදය

මෙය ජාතිකවාදයේ සම්භාව්‍ය ස්වරූපය යි. මෙහි ප්‍රධාන ලක්ෂණය වන්නේ ජාතික රාජ්‍ය අනන්‍යතාව පදනම් කරගැනීම යි.

යුරෝපයේ 18 සියවසේ ඇති වූ ජාතික රාජ්‍ය මාදිලියේ හරය ''එක් ජාතියක්-එක් රාජ්‍යයක්'' යන සමීකරණය අනුව එක් ජාතියකට අයත් වැසියෝ එම රාජ්‍යයට අයත් වෙති.

ජාතියට ඇති අයත් වීම, බැඳීම සහ ආදරය යනු එම ජාතියේ රාජ්‍යය සමඟ ද අනන්‍ය වීමෙන් ලැබෙන බැඳීම හා රාජ්‍යයට ආදරය කිරීම යි.

නිදː- ශ්‍රී ලාංකික ජාතිය, ඉන්දියානු ජාතිය, තායිලන්ත ජාතිය වශයෙන් ප්‍රකාශ වන්නේ මෙම ජාතික-රාජ්‍යවාදී ජාතිකවාදී පරිකල්පනය යි.

ClassWork.LK

# ජනවාර්ගික ජාතිකවාදය

ජාතික රාජ්‍යයක් තුළ ජීවත් වන වාර්ගික ප්‍රජාවන් අතර ඇතිවන සාමූහික ප්‍රජා කණ්ඩායමක් පිළිබඳ දේශපාලන විඥානය ''වාර්ගික ජාතිකවාදය'' (Ethnic Nationalism) යනුවෙන් හැඳින්වේ.

ඊට ද පදනම් වන්නේ භාෂාව, ආගම, සංස්කෘතිය පොදු අනන්‍යතා සාධක ය. වාර්ගික ජාතිකවාදී විඥානය පැන නඟින්නේ තමා ද සාමාජිකත්වය දරන ජාතික රාජ්‍ය පවත්නා ජාතික-රාජ්‍ය ජාතිකවාදයෙන් ද තමාට සමානත්වය හා අයිතිවාසිකම් නොලැබෙන බව හා තමා වෙනස්කම්වලට භාජනය වන බව පවසන දුක් ගැනවිලිද සමඟ ය.

එවැනි වාර්ගික ජාතිකවාදවල දේශපාලන ඉල්ලීම්වල සමාන අයිතිවාසිකම්, ප්‍රදේශීය ස්වයං-පාලනය සහ වෙන් වීම යන ඉලක්ක ද ඇතුළත් වේ.

Class Work.LK

18 සියවසේ සිට ජාතිවාදයේ ඓතිහාසික අත්දැකීම මිශ්‍ර එකකි. එය සාධනීය මෙන් ම නිෂේධනීය ප්‍රතිඵල ද අත්කර දී තිබේ.

1. ලෝකයේ නූතන රාජ්‍ය පද්ධතිය, මූලික වශයෙන් ම ජාතික-රාජ්‍යවාදී ජාතිකවාදය විසින් තීරණය කෙරේ.

2. දේශපාලන නිදහස, විමුක්තිය පිළිබඳ අදහස ජාතිකවාදය ඉතා ප්‍රබල ජන සාමූහික විඥානයට එක්කර තිබේ.

3. අත්‍යන්ත ජාතිකවාදය, රාජ්‍ය මෙන් ම ජාතිකවාදී ව්‍යාපාරය ද යුද්ධ, ජන ඝාතන/සංහාර, ප්‍රචණ්ඩත්වය සඳහා මෙහෙයවා තිබේ.

ClassWork.LK

ClassWork.LK